20162

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2016**
**Year End Evaluation**

24.11.2016

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 03 |

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න. නම/විභාග අංකය ..............................

## I කොටස

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර අදාළ හිස්තැන මත ලියන්න.



ඉහත රූපයෙන් දැක්වෙන්නේ (01) .................................... යුගයට අයත් (02) .................................... විහාරයේ කෞතුකාගාරය තුළ දැකියහැකි (03) .................................... නමැති කැටයමයි. මෙම කැටයම තුළින් (04) .................................... නිරූපනය වන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පවසන අතර, මෙම කැටයමට ඉන්දීය (05) .................................... කලා ආභාෂය ලැබී ඇති බව විචාරක මතයයි.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත්ම ගැලපෙන නිවැරදි පිළිතුර අදාළ පිළිතුරු අතරින් තෝරා, ඊට හිමි අංකය තිත් ඉරමත ලියන්න.

(06) දුම්බර පැදුරු කර්මාන්තයේ දී හමුවන කින්නර කලාලයන්හි දැකිය හැකි මෝස්තරයක් වන්නේ,
  (1) දිව්‍ය සහ උද්භිද මෝස්තරය
  (2) පැපිරස් පැළෑටි ආශ්‍රිතව කල ජ්‍යාමිතික මෝස්තරය
  (3) කුරුල්ලන්, මල් හා සත්ත්ව සැරසිලි සහිත මෝස්තරය
  (4) පංචනාරි සටය ආශ්‍රිතව කල මෝස්තරය (..........)

(07) පනාවිටිය අම්බලමේ දැකිය හැකි දවමුවා කැටයමක් වන්නේ,
  (1) නයි දඟරය සහිත කැටයම ය
  (2) තරුණ ලියන්නෙකුගේ ඉරියව්ව සහිත කැටයම ය
  (3) ඇත්, අස්, ගව, සිංහ කැටයම ය
  (4) වාදක පෙරහැර සහිත කැටයම ය (..........)



Learning Resource Center
De Mazenod College
Kandana

(08) පැරණි ශිල්පීන්ගේ විවිධ නිර්මාණ අතර කාන්තාවන් සමූහයක් අලියෙකුගේ හැඩයට නිර්මාණය කල සැරසිලි චිත්‍රයක් දැකිය හැකිය. එය නම් කර ඇත්තේ,

(1) සත්පනාරි පල්ලැක්කිය යනුවෙනි (2) ද්විනාරි රථය යනුවෙනි

(3) අෂ්ට නාරි තුරඟා යනුවෙනි (4) නව නාරි කුඤ්ඤරය යනුවෙනි (..........)

(09) අතීතයේ සිට මේ දක්වාම ශ්‍රී ලංකාව තුළ පිත්තල කර්මාන්තය ප්‍රචලිතව පවතී. පිත්තල කර්මාන්තයේ දී භාවිතවන එක් ශිල්ප ක්‍රමයක් වන්නේ තලන වැඩ හෙවත් තහඩු වැඩය. අනෙක් ශිල්ප ක්‍රමය වන්නේ,

(1) ඇඹීමය (2) නෙළීමය (3) වාත්තු වැඩය (4) තුන්දන් වැඩය

(..........)

(10) සබන් දවටනයක් නිර්මාණය කිරීම අයත් වන්නේ,

(1) ග්‍රැෆික් චිත්‍ර ගණයටය

(2) මොනොක්‍රෝම් ගණයටය


(3) එච්න් නම් වූ ගණයටය

(4) සන්නිදර්ශන චිත්‍ර ගණයටය (..........)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති **ABCDE** යන රූප සටහන් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A



B



C



D



E

(11) A අක්ෂරයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පොත්ගුල් විහාරය ඉදිරිපිට දැකිය හැකි මානව රුව සහිත සුවිසල් සෙල් ප්‍රතිමාවයි. මහාචාර්ය සෙනරත් පරණවිතාන මතයට අනුව මොහුගේ අතෙහි ඇත්තේ කුමක් ද? ..................................................................

(12) අනුරාධපුර යුගයේ විශිෂ්ට සඳකඩ පහණේ රූපයක් B අක්ෂරයෙන් දැක්වේ. මෙය හමුවන්නේ කුමන ස්ථානයකින් ද? ...............................................................

(13) බුද්ධ ප්‍රතිමාවල දැකිය හැකි විරළ ආසන ක්‍රමයක් C අක්ෂරයෙන් දක්වේ. එම ආසන ක්‍රමය කුමක් ද? ..............................................................

(14) D අක්ෂරයෙන් දැක්වෙන්නේ පොලොන්නරු නටබුන් අතර දැකිය හැකි සුවිශේෂී ගෘහ නිර්මාණයකි. එය නම් කර ඇත්තේ කෙසේ ද? ..................................................................

(15) ශ්‍රී ලංකාවේ හමුවන පැරණි විශිෂ්ට සිතුවමක් E රූපයේ දැක්වේ. එය අයත්වන යුගය කුමක් ද?

......................................................................

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වල නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

(16) ශ්‍රී ලංකාවේ පාරම්පරික කර්මාන්තයක් වන වෙස්මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ නගරයක් වන්නේ ................................................ ය.


(17) අනුරාධපුර යුගයේ හමුවන හොඳම බුද්ධ ප්‍රතිමාවක් වන අව්කන බුදුරුවෙහි දක්වෙන්නේ ................................................ මුද්‍රාවය.

(18) පාරම්පරික පැරණි චිත්‍ර අතර එන දිව්‍ය ගණයේ නිර්මාණ ලෙසට සැලකෙන්නේ සූර්ය සහ ................................................ රූපය,

(19) බෝසතුන්ගේ 'දුෂ්කරක්‍රියා' නමැති සුප්‍රසිද්ධ මූර්තිය අයත්වන්නේ ඉන්දිය ................................... කලාවට ය.

(20) චෛත්‍යයක් අව්වැසි වලින් ආරක්ෂා කිරීමට සාදා ඇති ගෘහය ................................................ නමින් හැඳින්වේ.


- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති රූප සටහන් වලට ගැලපෙන රූප සටහන **F G H I J** යන රූප වලින් තෝරා ඊට අදාළ අක්ෂරය තිත් ඉර මත ලියන්න.

(21)  (................)

(22)  (................)


(23)  (................)

(24)  (................)


(25)  (................)

F 

G 

H 

I 

J 

- ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ චිත්‍ර කලාවට අදාළ වාක්‍යයන් ලියන්න.

(26) නිර්ජීවී මෝස්තර - ..............................


(27) ආදිත්‍ය - ..............................

(28) දුර්වාස්ර - ..............................

(29) පර්යාලෝකය - ..............................


(30) විද්‍යාධර ගුහාව - ..............................

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති රූප සටහන් නම් කරන්න.

(31)  ..............................

(32)  ..............................

(33)  ..............................

(33)  ..............................

(34)  ..............................

- ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන ඡායාරූව ඇසුරු කර ගන්න. ඉන්පසු ඒ පිළිබඳ කලාත්මක ඇගයීමක් කරන්න.



(36) හඳුනාගත් බව : ..............................

(37) යුගය : ..............................

(38) තේමාව : ..............................

(39) ශිල්පීය කුසලතා : ..............................

(40) සමස්ත ඇගයීම : ..............................

(ලකුණු 40)